# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO – 745 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 02/05/2024 පැය 1115

## මාධ්‍ය නිවේදනය

**රුපියල් කෝටි 15 ක පමණ වටිනාකමින් යුත් හෙරොයින්, හැෂ් හා කොකේන් මත්ද්‍රව්‍ය හා මුදල් ලක්ෂ 15 ක් සමඟ සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකාය.**

පොලිස්පතිතුමාගේ යුක්තිය මෙහෙයුම සංකල්පය මත මුළු දිවයිනම ආවරණය වන පරිදි විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා බෙදාහරින්නන්ගේ ජාලයන් මර්ධනය කර මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ ක්‍රියාකාරකම් මැඩලීම සඳහා සිදු කරනු ලබන වැඩසටහනට සමගාමීව 2024.05.02 වන අද දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අසල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර රුපියල් කෝටි 15 කට අධික වටිනාකමකින් යුත් හෙරොයින් කිලෝග්‍රෑම් 13 ග්‍රෑම් 339 ක්, හැෂ් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 06 ග්‍රෑම් 395 ක්, කොකේන් ග්‍රෑම් 539 ක් සහ මුදල් රුපියල් ලක්ෂ 15 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු හා සැකකාරියක් මත්ද්‍රව්‍ය ප්‍රවාහනයට භාවිතා කරන ලද කාර් රථයක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 51 ක් හා සැකකාරිය වයස අවුරුදු 45 ක් වන පන්නිපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මොහු වසර 02ක පමණ කාලයක සිට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය අවට ප්‍රදේශයේ පිහිටි කුලී පදනම මත ලබා ගත් නිවසක සිට මහාපරිමාණ ලෙස මත්ද්‍රව්‍ය ජාවාරමේ නිරතව ඇති බවට අනාවරණය වී ඇති අතර 2024.04.24 වන දින මෙම මත්ද්‍රව්‍ය බෙදා හැරීමට අදාලව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලිපිකරුවෙකු ගුන්ඩ්පාස් පොලිස් වසමේදී හෙරොයින් කිලෝග්‍රෑම් 01 ග්‍රෑම් 60 ක් හා මුදල් රුපියල් ලක්ෂ 49 ක් සමඟ අත් අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් ඉහත සැකකරු මේ වන විට ඩුබායි රාජ්‍යයේ සැඟව සිට මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම මෙහෙයවන මත්ද්‍රව්‍ය ජාවාම්කරුවෙකුගේ මෙරට ප්‍රධාන මත්ද්‍රව්‍ය ජාවාරම මෙහෙයවන පුද්ගලයෙකු බවට අනාවරණය වී ඇත.

මෙම වැටලීමට අදාල ඡායාරූප






**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**